කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

**ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය** (අධ්‍යයන ධාරා)

දෙවන සෙමෙස්තරය - 2016/2017

**SLG 2219 - නිර්මාණාත්මක ලේඛනය**

(පැ දෙකයි)

**ප්‍රශ්න හතරකට (04) පමණක්** පිළිතුරු සපයන්න.

---

1. ශාස්ත්‍රීය ලේඛනය සහ නිර්මාණාත්මක ලේඛනය සම්බන්ධ මූලික ලක්ෂණ පැහැදිලි කරමින් ''නිර්මාණාත්මක ලේඛකයාගේ අරමුණ'' සාකච්ඡා කරන්න.

2. ''නිර්මාණකරණයේදී කලාකරුවා අද්දැකීම් ප්‍රතිනිර්මාණය කරන්නේය'' මේ පිළිබඳ සනිදර්ශන විග්‍රහයක යෙදෙන්න.

3. ''ජීවන දෘෂ්ටියේ පෘථුලත්වය නිර්මාණයක සාර්ථකත්වය කෙරෙහි අත්‍යන්තයෙන් ම බලපායි.'' නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

4. පෞද්ගලික අද්දැකීමක් ප්‍රතිනිර්මාණය සම්බන්ධ ඔබේ අදහස්, ඊට අදාළ නිර්මාණයක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

5. පහත දැක්වෙන ලේඛකයන් අතුරින් එක් අයෙකු තෝරා ගෙන නිර්මාණාත්මක ලේඛනය සම්බන්ධයෙන් ඔහුගේ අනන්‍යතාව පහදන්න.

   I. මාර්ටින් වික්‍රමසිංහ

   II. මුනිදාස කුමාරතුංග

   III. අජිත් තිලකසේන

6. ගුත්තිල ජාතකය නිර්මාණය කිරීමේ දී ගුත්තිල කවියා සතු ප්‍රතිභාව අභිමත වැනුම් දෙකක් ඇසුරින් සාකච්ඡා කරන්න.

7. ''සම්භාව්‍ය සාහිත්‍යකරුවෝ නිර්මාණාත්මක ලේඛනයේ දී සංක්ෂිප්ත රීතිය ද භාවිත කළහ'' අමාවතුර ඇසුරෙන් විග්‍රහයක යෙදෙන්න.

**** **** **** **** ****